# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# මාධ්‍යවේදී පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාර සැපයීම

# ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන - 2018

**01. අරමුණ**

- ශ්‍රී ලාංකික ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයභාවය ඉහළ නැංවීම

**02. ඉලක්කගත කණ්ඩායම**

- දිවයිනේ පිළිගත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල පූර්ණකාලීන හෝ අර්ධකාලීන පදනම මත සේවයෙහි නියැළී සිටින මාධ්‍යවේදීන්
- නිදහස් මාධ්‍යවේදීන්
- ප්‍රාදේශීය මාධ්‍යවේදීන්
- වෙබ් මාධ්‍යවේදීන්

**03. තෝරාගැනීමේ නිර්ණායකයන්**

- වසර 03 ක සේවා කාලය සපුරා ඇති ඉහත අංක 02 හි සඳහන් මාධ්‍යවේදියෙකු විය යුතුය.
- සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන දිනය වන විට පිළිගත් විශ්වවිද්‍යාලයක, උසස් අධ්‍යාපන පුහුණු ආයතන මගින් පවත්වනු ලබන මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති), උපාධි, ඩිප්ලෝමා, දිගුකාලීන හා කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබ තිබීම හෝ දැනට පාඨමාලාවක් හදාරන අයකු විය යුතුයි.
  (සම්මුඛ පරීක්ෂණයේදී පාඨමාලාව සඳහා තෝරාගත් බවට හෝ එය හදාරන බවට අදාළ ආයතන විසින් නිකුත් කරනු ලැබූ ලිපි ඉදිරිපත් කළ යුතුය.)
- ඉල්ලුම්කරනු ලබන පාඨමාලාව සෘජුවම මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ පාඨමාලාවක් විය යුතුය.
- වයස අවුරුදු 18 – 55 අතර විය යුතුය.
- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදීන් සඳහා නිකුත් කෙරෙන මාධ්‍යවේදී හැඳුනුම්පත ලබා තිබිය යුතුය.
- මාධ්‍යවේදියෙකුට මෙම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මගින් දෙවරක් ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව ලැබෙන අතර, පළමු අවස්ථාවේ සුදුසුකම් ලබාගැනීමෙන් වසර 5 කට පසුව දෙවන අවස්ථාව සඳහා අයදුම් කළ හැකිය.

**04. මූල්‍ය පහසුකම් ලබාදීම**

- පාඨමාලාව සඳහා ගෙවනු ලබන ශිෂ්‍යත්ව මුදල උපාධි හා පශ්චාද් උපාධි වෙනුවෙන් උපරිමය රුපියල් ලක්ෂ දෙකක මුදලක් (රු.200,000/–) හා දිගුකාලීන හා කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලා සඳහා උපරිමය රුපියල් ලක්ෂයක (රු.100,000/–) මුදලකි.
- ශිෂ්‍යත්ව සඳහා හිමිකම් ලබන මාධ්‍යවේදීන්ට පාඨමාලාව සඳහා වන ගාස්තුවෙන් 50% ක් පාඨමාලාව ආරම්භයේදී පළවෙනි වාරිකය ලෙසත්, ඉතිරි 50% න් 25% ක් පාඨමාලාවේ දෙවන වාරිකය ලෙසත්, ඉතිරි 25% පාඨමාලාව සම්පූර්ණ කර සහතිකය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෙවීම සිදු කෙරේ.

**05. තෝරාගැනීමේ ක්‍රමවේදය**

- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන තේරීම් කමිටුවක් මගින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ප්‍රතිලාභීන් තෝරාගනු ඇත. තෝරා ගැනීමේ අවසාන තීරණය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

**06. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

- පහත සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.07.16 දින හෝ එදිනට පෙර ලැබෙන ලෙස **අධ්‍යක්ෂ (මාධ්‍ය), මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන 2018" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සැලකිය යුතුයි.**

* ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් අනතුරුව අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, අදාළ පාඨමාලාව උපරිම මාස 6 ක් ඇතුළත ආරම්භ කළ යුතුවේ. නොඑසේ නම් ශිෂ්‍යත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

**විමසීම් : 0112-513645, 0112-513459, 0112-513460**
**වැඩි විස්තර :** www.media.gov.lk

**ආචාර්ය ආර්. එච්. එස්. සමරතුංග**
**ලේකම්,**
**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**

# ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන - 2018
## මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

01. සම්පූර්ණ නම සිංහලෙන් (මයා/මිය/මෙය) : ..................................................

02. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් : ..................................................

03. මුලකුරු සමග නම : ..................................................

04. පෞද්ගලික ලිපිනය - සිංහල : ..................................................

ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) : ..................................................

05. පෞද්ගලික දුරකථන : ජංගම .................... නිවස ....................

06. උපන් දිනය : ..................................................

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවු .............. මාස .............. දින ..............

08. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................

09. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම : ..................................................

10. අයදුම්කරන පුහුණු පාඨමාලාවේ විස්තර

I පාඨමාලාවේ නම : ..................................................

II පුහුණු ආයතනය : ..................................................

III කාලය : ..................................................

IV පාඨමාලාවේ ගාස්තු : ..................................................

11. අදාළ ආයතනය වෙතින් පාඨමාලාව සඳහා සුදුසුකම් ලබා ඇති බවට ඔබ වෙත යොමු කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකි ද?

හැකිය ☐ නොහැකිය ☐

12. රජය මගින් පිරිනමන වෙනත් පුහුණු වැඩසටහන් යටතේ මූල්‍යමය ප්‍රතිපාදන ලබාගෙන තිබේද ?

පාඨමාලාවේ නම : ..................................................

ආයතනය : .................................... කාලය : ....................

13. සේවා විස්තරය

* රැකියා තත්වය ස්ථිර ☐ තාවකාලික ☐ ප්‍රාදේශීය ☐ නිදහස් ☐ වෙබ් ☐
* තනතුර : ..................................................
* සේවා ආයතනයේ නම : ..................................................
* පුවත්පත / නාලිකාව / අනෙකුත් : ..................................................
* කාර්යාලීය ලිපිනය : ..................................................
* දුරකථන අංකය : කාර්යාලය .................... ෆැක්ස් අංකය ....................
* විද්‍යුත් ලිපිනය (පෞද්ගලික) : ..................................................
* ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද හැඳුනුම්පත් අංකය .................... වර්ෂය ..........
* රැකියා පළපුරුද්ද (අවුරුදු) : ..................................................
* ආවරණය කරන දිස්ත්‍රික්කය : ..................................................

14. මීට පෙර මෙම ශිෂ්‍යත්ව ආධාර ක්‍රමය යටතේ මූල්‍යමය ප්‍රතිපාදන ලබාගෙන තිබේද ? ඔව් ☐ නැත ☐

ඔව් නම් පාඨමාලාව සහ වර්ෂය : ..................................................

මෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : .................... අයදුම්කරුගේ අත්සන ....................

---

### ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

.................................................. මහතා/මහත්මිය/මෙනවිය අප ආයතනයේ පූර්ණකාලීන, අර්ධකාලීන, ප්‍රාදේශීය, නිදහස්, වෙබ් මාධ්‍යවේදියෙකු ලෙස .................... සිට .................... දින දක්වා රාජකාරී කරන බවත්, උක්ත ශිෂ්‍යත්ව අරමුදල සැපයීමට සුදුසු බවත් නිර්දේශ කරමි. මෙහි පහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

01. නම : ..................................................

02. තනතුර : ..................................................

03. ලිපිනය : ..................................................

04. දුරකථන අංකය : ..................................................

..................................................

අත්සන, දිනය සහ නිල මුද්‍රාව